# "වසත් සිරිය" සිංහල හා දෙමළ අලුත් අවුරුදු උලෙළ 2023
# දිවයිනටම විවෘත ස්ටැන්ඩර්ඩ් පාපැදි ධාවන තරඟය 2023 අප්‍රේල් මස 22 වන දින
## පිරිමි සහ කාන්තා තරඟ

**තරඟ සංවිධානය:** ශ්‍රී ලංකා ගුවන් හමුදාව　　**තරඟ මෙහෙයවීම:** ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය

**පිරිමි තරඟය :** ගාලු මුවදොර පිටිය, මීගමුව පාර ඔස්සේ, ජා-ඇල, කටුනායක, මිනුවන්ගොඩ, වේයන්ගොඩ, නිට්ටඹුව, නුවර පාර, කඩවත, පැලියගොඩ, ගාලු මුවදොර පිටිය

**කාන්තා තරඟය:** ගාලු මුවදොර පිටිය, ගාලු පාර ඔස්සේ පාමංකඩ, පිලියන්දල, කැස්බෑව, කොට්ටාව, මහරගම, නුගේගොඩ, තුම්මුල්ල හංදිය, පිත්තල හන්දිය, ලේක් හවුස්, ගාලු මුවදොර පිටිය

**සහභාගීත්වය:** 1973 වසරේ හා ඉන් පසුව සහ 2004 වසරේ හා ඉන් පෙර වසර වල උපත ලැබූ ශ්‍රී ලාංකීය පිරිමි සහ කාන්තා පාපැදි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට තරඟයට සහභාගී විය හැක.

**පාපැදියේ වර්ගීකරණය:** ස්ටැන්ඩර්ඩ් බයිසිකල් ඉදිරිපස සහ පසුපස දැති 48 සහ 18, හැඬලයේ රෙස්ට් බාර් /හැක් බාර් සමග තරඟ කිරීම තහනම්වේ.

**තරඟ අයදුම්පත් භාර ගැනීම:** මේ සමග ඇති අයදුම් පත පුරවා රජයේ ලියපදිංචි වෛද්‍යවරයෙකු ලවා තරඟකිරීමට හැකි යහපත් සෞඛ්‍ය තත්ත්වයේ පසුවන බවට සහතික කොට සංවිධායක මණ්ඩලය වෙත තැපැලෙන් හෝ, ගෙනැවිත් භාර දීම හෝ Whatsapp පණිවුඩයක් ඔස්සේ එවිය හැක. 2023 අප්‍රියෙල් 21 දින පෙ.ව. 1000 පැයෙන් පසු ලැබෙන අයදුම් පත් පිලිගැනෙනු නොලැබේ. පිලිගන්නා ලද අයදුම් පත් Whatsapp පණිවුඩයක් ඔස්සේ දැනුම් දෙනු ලැබේ. අයදුම් කිරීම හා ලියාපදිංචිය සඳහා මුදල් අය නොකෙරේ.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය:**
ශ්‍රී ලංකා ගුවන් හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂක කාර්‍යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර, කොලඹ.
ලියුම් කවරයේ වම්පස ඉහල කෙරවල "වසත් සිරිය 2023 ස්ටැන්ඩර්ඩ් පාපැදි ධාවන තරඟය" යනුවෙන් සඳහන් කල යුතුය.

ඇයදුම්පත් ගෙනැවිත් භාර දෙන්නේ නම්, ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර, කොලඹ (කොම්පඤ්ඤ වීදිය පොලීසිය අසල රයිෆල් ග්‍රීන් ක්‍රීඩාපිටියට යබදව ඇති) ප්‍රධාන ආරක්ෂක මැදිරියට භාර දිය හැක. [භාර දුන් බව රැගෙන එන පුද්ගලයා ඒ සඳහා තබා ඇති පොතේ අත්සන් තැබිය යුතුවේ]

**Whatsapp පණිවුඩයක් ඔස්සේ අයදුම් පත් එවීම:** පුරවන ලද අයදුම් පතේ පැහැදිලි ඡායාරූපයක් 0788429688 යන දුරථන අංකයට Whatsapp ඔස්සේ එවිය යුතුවේ.

**තරඟ අංක ලබා දීම :** තරඟකරුවන් හෝ අයදුම්පතේ නම සඳහන් කලමණාකරුවෙකුට 2023 අප්‍රියෙල් 21 වන දින ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර, කොලඹ (රයිෆල් ග්‍රීන් ක්‍රීඩාපිටියට යබදව ඇති) ප්‍රධාන ආරක්ෂක මැදිරියට පස්වරු 1600 පැයේ සිට 2000 පැය දක්වා පැමිණ තරඟකරුවන්ගේ අංක ලබා ගත හැකිවේ. තරඟ පැවැත්වෙන දින දී අංක ලබා දීම සිදු නොකෙරේ. තරඟකරුවන් සඳහා නවාතැන් පහසුකම් හෝ ආහාරපාන හෝ තාක්ෂණික පහසුකම් සංවිධායකයින් විසින් ලබා දෙනු නොලැබේ.

**තරඟකරුවන්/ තරඟකාරියන් ලියාපදිංචි කිරීම:** 2023 අප්‍රියෙල් මස පෙරවරු 0700 සිට පෙරවරු 0800 දක්වා සම්පූර්ණ ක්‍රීඩා ඇඳුමින් සැරසී (තරඟ අංක පැලඳ) පාපැදියද සමග ජාතික හැඳුනුම්පතද රැගෙන ගාලු මුවදොර පිටියේ පිහිටි තරඟ ආරම්භක ස්ථානයට ලියපදිංචිය සඳහා පැමිණ විනිසුරුවන් විසින් කරනු ලබන පරීක්ෂාවෙන් පසු තරඟ ආරම්භ ලේඛනයේ අත්සන් තැබිය යුතුවේ. එසේ කිරීමට අපොහොසත් වන තරඟකරුවන්/ තරඟකාරියන් තරඟ ආරම්භය නොකල බවට සලකනු ලැබේ.

**තරඟ ජයග්‍රහණය** :- තරඟය කේවල වර්ගීකරණය යටතේ පැවැත්වෙන අතර අවසන් රේඛාව මුලින්ම පසුකරන ක්‍රීඩකයා/ ක්‍රීඩිකාව තරඟය ජයග්‍රහණය කරනු ඇත.

**ත්‍යාග මුදල් හා කුසලාන**

ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් සඳහා පහත පරිදි කුසලාන හා මුදල් ත්‍යාග පිරිනැමීමට කටයුතු කෙරේ.
ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන - කුසලාන, මුදල් ත්‍යාග හා සහතික පත්
සිව්වන ස්ථානයේ සිට දස වන ස්ථානය දක්වා - මුදල් ත්‍යාග හා සහතික පත්
දස වන ස්ථානයේ සිට විසි වන ස්ථානය දක්වා- මුදල් ත්‍යාග (පිරිමි තරඟය පමණි)

## "වසත් සිරිය" සිංහල හා දෙමළ අලුත් අවුරුදු උලෙළ 2023

## දිවයිනටම විවෘත ස්ටෑන්ඩර්ඩ් පාපැදි ධාවන තරගය 2023 අප්‍රේල් මස 22 වන දින

**මුදල් ත්‍යාගයන් පහත පරිදි වේ.**

| පිරිමි තරගය | | |
|---|---|---|
| අනු අංකය | ස්ථානය | ත්‍යාග මුදල රු. |
| 1 | පලමු ස්ථානය | 100,000.00 |
| 2 | දෙවන ස්ථානය | 75,000.00 |
| 3 | තෙවන ස්ථානය | 50,000.00 |
| 4 | සිව්වන ස්ථානය | 30,000.00 |
| 5 | පස්වන ස්ථානය | 20,000.00 |
| 6 | 6 සිට 10 ස්ථාන (9,000 X 5) | 9,000.00 |
| 7 | 11 සිට 15 ස්ථාන (5,000 X 5) | 5,000.00 |

| කාන්තා තරගය | | |
|---|---|---|
| අනු අංකය | ස්ථානය | ත්‍යාග මුදල රු. |
| 1 | පලමු ස්ථානය | 50,000.00 |
| 2 | දෙවන ස්ථානය | 40,000.00 |
| 3 | තෙවන ස්ථානය | 30,000.00 |
| 4 | සිව්වන ස්ථානය | 20,000.00 |
| 5 | පස්වන ස්ථානය | 15,000.00 |
| 6 | 6 සිට 10 ස්ථාන (9,000 X 5) | 9,000.00 |

තරග පැවැත්වෙන විට NEUTRAL SERVICE රථය හරහා වතුර සහ සුළු තාක්ෂණික ආධාර ලබා දෙනු ඇත. තරගය පසු පස යතුරු පැදි හෝ වෙනත් වාහන මගින් පැමිණ ආධාර ලබාදීම තහනම්වේ. තරග කරුවන් හා අධාර කරුවන් සියලු මාර්ග නීති වලට යටත්වේ. ලබාදී ඇති තරග අංක තරගය අවසානය තෙක් පැළඳ සිටිය යුතුවේ. සියලු තරගකරුවන් හා තරගකාරියන් තරගාරම්භයේ සිට අවසානය දක්වා ආරක්ෂිත හෙල්මටයක් පැළඳ සිටිය යුතුවේ. එලෙස කටයුතු නොකරන තරගකරුවන් හා තරගකාරියන් තරගයෙන් ඉවත් කෙරෙනු ඇත. නිධන්ගත රෝගාබාධ සහ දුබලතාවලින් වලින් පෙලෙන තරගකරුවන් හා තරගකාරියන් තරග වැදීමෙන් වැලකී සිටිය යුතුවේ. දුම්රිය මාර්ග වසා ඇති විට ඒ හරහා ගමන් ගන්නා තරගකරුවන් හා තරගකාරියන් තරගයෙන් ඉවත් කෙරෙනු ඇත. තරගය සඳහා ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය මගින් නිකුත් කොට ඇති නීතීන් අදාල වනු ඇත. තරග විනිශ්චය සඳහා යම් විරෝධතාවයක් ඇතොත් එය ලිඛිතව සඳහන් කොට රු. 1,000.00 මුදලක් හා විරෝධතාවය ඔප්පු කිරීමට යම් සාක්ෂ්‍යක් ඇතොත් එවාද සමග ප්‍රධාන විනිසුරු වෙත තරගයේ පලමු ක්‍රීඩකයා/ ක්‍රීඩිකාව තරගය නිම කර මිනිත්තු 30 ක් කාලයක් ඇතුලත භාර දිය යුතුවේ. විරෝධතාව සත්‍ය බව සනාථ වුවහොත් ගෙවූ මුදල නැවත ලබා දෙනු ඇත. විනිසුරු මඬුල්ලේ තීරණය අවසාන තීරණය වේ.

**<u>තරග අරාම්භය:</u>**

කාන්තා තරගය; පෙරවරු 0830 පිරිමි තරගය: පෙරවරු 0845

**<u>ත්‍යාග ප්‍රධානෝත්සවය:</u>** ත්‍යාග ප්‍රධානෝත්සවය 2022 අප්‍රියෙල් මස් 22 දින පස්වරු 1800 පැයට ගාලු මුවදොර පරිශ්‍රයේදී පැවැත්වේ. ජයග්‍රාහකයින් හා ජයග්‍රාහිකාවන් ඒ සඳහා සිය පාපැදි ක්‍රීඩා ඇඳුම හෝ සිය ක්‍රීඩා සමාජය නියෝජනය වන් අයුරින් සැකසූ track kit (bottom & top) සහ සපත්තු වලින් සැරසී සහභාගී විය යුතුවේ.

## "වසත් සිරිය" සිංහල හා දෙමළ අලුත් අවුරුදු උලෙළ 2023
## දිවයිනටම විවෘත ස්ටැන්ඩර්ඩ් පාපැදි ධාවන තරඟය 2023 අප්‍රේල් මස 22 වන දින

පිරිමි පාපැදි තරගය- මාර්ග ධාවන සටහන

| ක්‍රියාවලිය | ස්ථානය | දුර කි.මී | |
|---|---|---|---|
| ආරම්භය | ගාලු මුවදොර පිටිය | 0.0 | |
| දකුණට හැරවීම | ලෝටස් පාර වට රවුම | 0.8 | |
| ඉදිරියට | ලෝටස් පාර | | |
| දකුණට හැරවීම | යෝර්ක් පාර | 1.3 | |
| ඉදිරියට | මැකලම් පාර | | |
| වමට හැරවීම | ගාමිණී හෝල් | 3.8 | |
| වමට හැරවීම | මරදාන ගුවන් පාලම | 4.0 | |
| දකුණට හැරවීම | ටෙක්නිකල් හංදිය | 4.6 | |
| ඉදිරියට | සංඝරාජ මාවත | | |
| ඉදිරියට | පංචිකාවත්ත හංදිය | 5.2 | |
| ඉදිරියට | ප්‍රදීපා මාවත | | |
| වමට හැරවීම | ඉංග්‍රීම් හංදිය | 6.8 | |
| ඉදිරියට | බේස්ලයින් පාර | | |
| වමට හැරවීම | පැලියගොඩ හංදිය | 8.6 | |
| දකුණට හැරවීම | නවලෝක වට රවුම | 9.2 | |
| (නිල ආරම්භය) | මයි කාගෝ / ඩේවිඩ් වික්‍රමරත්න | 9.7 | 0.0 |
| ඉදිරියට | වත්තල | | 3.4 |
| ඉදිරියට | කදාන | | 10.1 |
| ඉදිරියට | සීදූව | | 19.6 |
| දකුණට හැරවීම | 18 වන සැතපුම් කණුව | | 25.8 |
| දුම්රිය හරස් මාර්ගය | කටුනායක | | 26.4 |
| ගුවන් හමුදා මාර්ග බාදකය | ආඩිඅම්බලම | | 29.5 |
| ඔරලෝසු කණුව ඉදිරියට | මීනුවන්ගොඩ | | 36.8 |
| ඉදිරියට | නයිවල | | 46.5 |
| වමට හැරවීම | වේයන්ගොඩ ගුවන් පාලම | | 50.3 |
| මාර්ග සංඥා එලි දකුණට හැරවීම | නිට්ටඹුව | | 54.5 |
| ඉදිරියට | කළගෙඩිහේන | | 59.7 |
| ඉදිරියට | යක්කල | | 64.6 |
| ඉදිරියට | මිරිස්වත්ත | | 67.2 |
| ඉදිරියට | කඩවත (පැරණි කොළඹ පාර) | | 78.5 |
| ඉදිරියට | කිරිබත්ගොඩ | | 82.5 |
| ඉදිරියට | තොරණ හංදිය ගුවන් පාලම | | 85.6 |
| වමට හැරවීම | පැලියගොඩ | | 87.8 |
| දකුණට හැරවීම | ඉංග්‍රීම් හංදිය | | 90.0 |
| ඉදිරියට | ප්‍රදීපා මාවත | | |
| වමට හැරවීම | පංචිකාවත්ත හංදිය | | 91.6 |
| ඉදිරියට | පංචිකාවත්ත පාර | | |
| වමට හැරවීම | මරදාන ගුවන් පාලම | | 92.3 |
| දකුණට හැරවීම | පී ද එස් කුලරත්න මාවත | | 92.4 |
| දකුණට හැරවීම | ගාමිණී හොල් | | 92.7 |
| ඉදිරියට | මැකලම් පාර | | 93.0 |
| මාර්ග සංඥා එලි ඉදිරියට | ලේක් හවුස් | | 93.1 |
| වමට හැරවීම | යෝර්ක් පාර | | 93.2 |
| ඉදිරියට | ලෝටස් පාර | | |
| වමට හැරවීම | ලෝටස් පාර වට රවුම | | 93.6 |
| අවසානය | ගාලු මුවදොර පිටිය | | 94.8 |

කාන්තා පාපැදි තරගය- මාර්ග ධාවන සටහන

| ක්‍රියාවලිය | ස්ථානය | දුර කි.මී |
|---|---|---|
| ආරම්භය | ගාලු මුවදොර පිටිය | 0.0 |
| ආපසු හැරවීම (U Turn) | ලෝටස් පාර වට රවුම | 0.8 |
| ඉදිරියට | ගෝල්ෆේස් වට රවුම | 1.1 |
| ඉදිරියට | ගාලු පාර | |
| වමට හැරවීම | ලිබර්ටි ප්ලාසා දෙසට | 2.3 |
| දකුණට හැරවීම | ලිබර්ටි ප්ලාසා හංදිය | 2.5 |
| ඉදිරියට | ආර් ඒ ද මැල් පාර | |
| දකුණට හැරවීම | ශාන්ත පීතර ක්‍රීඩාපිටිය | 6.1 |
| වමට හැරවීම | ගාලු පාර | 6.5 |
| ඉදිරියට | ඩබ් ඒ ද සිල්වා පාර | 7.0 |
| දකුණට හැරවීම | පාමංකඩ හංදිය | 7.9 |
| වමට හැරවීම | පාමංකඩ පාලම | 8.6 |
| ඉදිරියට | කොහුවල හංදිය | 10.1 |
| ඉදිරියට | බොරලැස්ගමුව හංදිය | 13.8 |
| වමට හැරවීම | පිලියන්දල විකල්ප පාර | 18.1 |
| වමට හැරවීම | කැස්බෑව හංදිය | 25.3 |
| වමට හැරවීම | පොල්ගස්ඕවිට හංදිය | 28.2 |
| වමට හැරවීම | මත්තෙගොඩ හංදිය | 32.2 |
| වමට හැරවීම | කොට්ටාව හංදිය | 34.7 |
| ඉදිරියට | හයිලෙවල් පාර | |
| ඉදිරියට | මහරගම හංදිය | 39.3 |
| ඉදිරියට | නුගේගොඩ හංදිය (ගුවන් පාලම) | 44.2 |
| දකුණට හැරවීම | හැව්ලොක් ටවුන් බෝ ගස | 46.9 |
| දකුණට හැරවීම | තුම්මුල්ල හංදිය | 48.9 |
| වමට හැරවීම | කෞතුකාගාරය හංදිය | 50.5 |
| ඉදිරියට | මාකස් ප්‍රනාන්දු පාර | |
| වමට හැරවීම | ආනන්ද කුමාරස්වාමි මාවත | 50.8 |
| දකුණට හැරවීම | මල් පාර | 51.0 |
| මාර්ග සංඥා එලි ඉදිරියට | පිත්තල හංදිය | 51.1 |
| දකුණට හැරවීම | මැලේ වීදිය | 52.5 |
| වමට හැරවීම | ලේක් හවුස් හංදිය | 53.6 |
| වමට හැරවීම | යෝර්ක් පාර | |
| ඉදිරියට | ලෝටස් පාර | 53.7 |
| වමට හැරවීම | ලෝටස් පාර වට රවුම | 54.2 |
| අවසානය | ගාලු මුවදොර පිටිය | 55.0 |

**<u>“වසත් සිරිය” සිංහල හා දෙමළ අලුත් අවුරුදු උළෙළ 2023</u>**

**<u>දිවයිනටම විවෘත ස්ටැන්ඩර්ඩ් පාපැදි ධාවන තරඟය 2023 අප්‍රේල් මස 22 වන දින</u>**

තරඟ අයදුම්පත- පිරිමි තරඟය / කාන්තා තරඟය [අනවශ්‍ය වචනය කපා හරින්න]

| | |
|---|---|
| ක්‍රීඩා සමාජයේ නම | **(තරඟ කරුවන්ට පුද්ගලිකව හෝ ක්‍රීඩා සමජයක් හරහා හෝ අයදුම් කල හැකිවේ)** |

| | | |
|---|---|---|
| කළමණාකරුගේ නම<br><br>(කළමණාකරුවෙක් නොමැති නම් හිස්ව තබන්න WhatsAPP හරහා සම්බන්ධවිය හැකි දුරකථන අංකයක් මීලඟ කොටුවේ සඳහන් කරන්න) | දුරකථන අංකය | |
| | WhatsAPP අංකය | |

| ක්‍රීඩකයාගේ/ක්‍රීඩිකාවගේ නම **(පිරිමි හා කාන්තා තරඟ සඳහා වෙන් වෙන්ව අයදුම් පත් එවිය යුතුවේ)** | උපන් දිනය | ජාතික හැඳුනුම්පත් අංකය | තරඟවැදීමට සුදුසුබව නිගමනය කල වෛද්‍යවරයාගේ අත්සන සහ නිල මුද්‍රාව |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |
| 8. | | | |

ඉහත තොරතුරු සත්‍ය බව සහතික කරමි. මෙම ක්‍රීඩික ක්‍රීඩිකාවන් තරඟ නීති රීති හා මාර්ග නීතින් වලට අනුකූලව තරඟ වදින බව සහතික කරමි.

.................................................... ............................................................

කලමණාකරුගේ/ ක්‍රීඩකයා/ ක්‍රීඩිකාවගේ අත්සන සභාපති/ ලේකම් ගේ අත්සන සහ නිල මුද්‍රාව

ක්‍රීඩා සමාජ හරහා අයදුම් කරන තරඟකරුවන්/ තරඟකාරියන් වෙනුවෙන් ක්‍රීඩා සමාජයේ සභාපති/ ලේකම් සහ කලමණාකරු අත්සන් කල යුතුවේ. පුද්ගලිකව ඉදිරිපත් වෙන තරඟකරුවන්/ තරඟකාරියන් තනි තනිව අයදුම් පත් පුරවා තමන්ම අත්සන් කොට එවිය යුතු වේ.හැඳුනුම්පත් අංකය නොමැතිව හෝ වෛද්‍යවරයකුගේ සහතිකය නොමැතිව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. වැරදි හැඳුනුම්පත් අංක සටහන් කොට තිබෙනබව නිරීක්ෂණය වුවහොත් එම තරඟකරුවන් තරඟකාරියන් තරඟයෙන් ඉවත් කෙරෙනු ඇත. තරඟ පැවැත්වෙන දින දී අංක ලබා දීම සිදු නොකෙරේ. 2023 අප්‍රියෙල් 21 වන දින ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර, කොලඹ (රයිෆල් ග්‍රීන් ක්‍රීඩාපිටියට යබදව ඇති) ප්‍රධාන ආරක්ෂක මැදිරියට පස්වරු 1600 පැයේ සිට 2000 පැය දක්වා පැමිණ තරඟකරුවන්ගේ අංක ලබා ගත හැකිවේ